දිල්රුක්ෂි ඩබ්. එස්. ටි.
PAPER

**ග්‍රීක ශෝකාන්ත නාට්‍ය කෘතීන්ගෙන් පිළිබිඹු වන දේව සංකල්පය**

**ඩබ්. එස්. ටි. දිල්රුක්ෂි, කැලණිය විශ්වවිද්‍යාලය**

ග්‍රීක ජන ජීවිතයේ බොහෝ අවස්ථාවන්හිදී දේව සංකල්පය යෝධ සෙවනැල්ලක් මෙන් බැඳී තිබෙන ආකාරය දැක ගත හැකියග ප්‍රාථමික අවදියේදී බහුදේවවාදීන් වූ ග්‍රීකයෝ මනුෂ්‍ය පාලනයෙන් තොර ස්වාභාවික බලවේග දේවත්වයෙහිලා සැලකූහග එමෙන්ම මනුෂ්‍ය අභ්‍යන්තරයේ ඇති හැඟීම් හා සිතුවිලිවලට ද දේවත්වයක් ආරෝපණය කළේ ඒවා ද මනුෂ්‍ය පාලනයෙන් තොර වූ බැවිනිග මෙවන් පසුබිමක් තුළ ග්‍රීක නාට්‍ය කලාවේ ආරම්භය ද දේව මූලයකින් බිහි වියග දියෝනියස් දෙවියන් වන්දනා කිරීමේ චාරිත්‍රයන් ඔස්සේ ග්‍රීක නාට්‍ය කලාවේ ආරම්භය සනිටුහන් වන අතර ඇතැන්ස් නාට්‍යෝත්සවවලදී ද දෙවියන්ට උපහාර දැක්වීම ප්‍රධාන අරමුණක් වියග ග්‍රීක ශෝකාන්ත නාට්‍යයන්හි ද මෙම දේව සංකල්පය මිනිසාගේ දෛවය සමග දැඩිව බැඳී තිබෙන ආකාරය මැනවින් නිරූපණය වී තිබේග බොහෝ නාට්‍යවලදී ද දෙවියන් චරිතයක් වශයෙන් වේදිකාවට ගෙන්වීමෙන් ශෝකාන්ත නාට්‍ය සමග දේව සංකල්පයෙහි තිබෙන සමීප සබඳතාව පැහැදිලි වේ.

ග්‍රීක ශෝකාන්ත නාට්‍යකරුවන් තිදෙනා වන ඊස්කිල්ස් (Aeschylus)* ːක්‍රි.පූ. 525 - 456*ල සොෆොක්ලීස් (Sophocles)* ːක්‍රි.පූ. 496 - 406* හා යුරිපිඩීස් (Euripedes)* ːක්‍රි.පූ. 485 - 406* විසින් රචිත ශෝකාන්ත නාට්‍යකෘති විමර්ශනය කිරීමේදීල ඔවුන් දේව සංකල්පය සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් වූ සම්ප්‍රදායන් අනුගමනය කොට තිබෙන බව පැහැදිලි වේග ඊස්කිල්ස් හා සොෆොක්ලීස් දේව නීතිය ඉහලින් පිළිගත් අතර යුරිපිඩීස් දෙවියන් ගැරහීමට ලක් කළ බව පෙනේ.

මෙම පර්යේෂණ පත්‍රිකාව සඳහා ඊස්කිල්ස්ගේ ප්‍රොමිතියස් බන්ධනයී ːPrometheus Bound*සොෆොක්ලීස්ගේ ඊඩිපස් රජී ːOedipus Rex* හා යුරිපිඩීස්ගේ හිපොලිටසී ːHyppolytuෂී* යන නාට්‍ය කෘති ත්‍රිත්වය පාදක කර ගනු ලැබේග මෙම නාට්‍ය කෘතීන්හි අන්තර්ගතය විශ්ලේෂණය කොට එහි දක්නට ලැබෙන දේව සංකල්පය පිළිබඳ විග්‍රහ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණයිග මෙම පර්යේෂණයට අදාළ ඉහත නාට්‍ය කෘති ත්‍රිත්වය පරිශීලනය කොට ඊට අදාළ ලිඛිත මූලාශ්‍රය හා අන්තර්ජාලය පාදක කර ගනිමින් ඒ සම්බන්ධ දත්ත විශ්ලේෂණය කෙරේග මෙම ශෝකාන්ත නාට්‍යකරුවන් තිදෙනාගේ නාට්‍ය කෘති අතරින් දේව සංකල්පය මනාව පිළිබිඹු වන බවට සාධක ඉදිරිපත් කළ හැකි නාට්‍ය කෘති ත්‍රිත්වයක් පර්යේෂණ නියැදි ලෙස තෝරා ගැනේ.

මිනිසා පාලනය කරන අදෘශ්‍යමාන හස්තයක් වශයෙන් දෙවියන් නිරූපණය කර තිබීමත්ල දේව කැමැත්ත පරිදි සියලුම ක්‍රියාවන් සිදුවන ආකාරයත් නාට්‍ය කෘතීන්හි දක්නට ලැබීම දත්ත විශ්ලේෂණයේදී පැහැදිලි වන කරුණකිග ග්‍රීක ශෝකාන්ත නාට්‍ය කලාව සමඟ දේව සංකල්පය දැඩි ලෙස බැඳී තිබෙන බව මෙම පර්යේෂණයේ නිගමනය වන අතර ඒ සඳහා පාදක වී ඇති සාධක හා විස්තරාත්මක අධ්‍යයනයන් පර්යේෂණ පත්‍රිකාවේදී ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ය.

*ප්‍රමුඛ පද - ග්‍රීක ශෝකාන්ත නාට්‍ය, දේව සංකල්පය, ඊස්කිලස් , සොෆොක්ලීස් , යුරිපිඩීස්*